(නවවැනි පාර්ලිමේන්තුව -  දෙවැනි සභාවාරය)

අංක 16.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 මාර්තු 11 සිකුරාදා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෛයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු **ඉෂාක් රහුමාන් මහතා**

ගරු **මුජිබුර් රහුමාන් මහතා**

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**

ගරු **අජිත් රාජපක්ෂ මහතා**

ගරු **ගුණතිලක රාජපක්ෂ මහතා**

ගරු **උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

ගරු **ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා**

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා**

ගරු **රාජිකා වික්‍රමසිංහ මහත්මිය**

ගරු **රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

ගරු **චමින්ද විජේසිරි මහතා**

ගරු **එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

ගරු **මධුර විතානගේ මහතා**

ගරු **හේෂා විතානගේ මහතා**

ගරු **චන්දිම වීරක්කොඩි මහතා**

ගරු **ඩී. වීරසිංහ මහතා**

ගරු **වීරසුමන වීරසිංහ මහතා**

ගරු **දිලිප් වෙදආරච්චි මහතා**

ගරු **සිවඥානම් ශ්‍රීතරන් මහතා**

ගරු **මෛත්‍රීපාල සිරිසේන මහතා**

ගරු **ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

ගරු **රවුෆ් හකීම් මහතා**

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා**

ගරු **(මහාචාර්ය) චරිත හේරත් මහතා**

ගරු **සමන්ප්‍රිය හේරත් මහතා**

ගරු **මර්ජාන් ෆලීල් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) බොරලැස්ගමුව, අබේරත්න මාවත, රත්නාරාම පාර, අංක 23 දරන ස්ථානයෙහි පදිංචි ඒ. කේ. බෝයගොඩ මහතාගෙන් ලැබුණු 2022.01.19 දිනැති පෙත්සම;

(ii) මොරටුව, රාවතාවත්ත, දෙවනි පටුමග, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. කුවින්ටස් අන්තෝනි පිල්ලෙයි මහතාගෙන් ලැබුණු 2021.12.06 දිනැති පෙත්සම; සහ

(iii) ඉඹුල්ගස්දෙනිය, කුරුඳුවත්ත, අංක 44/6 දරන ස්ථානයෙහි පදිංචි එස්. එම්. ජී. එම්. සේනානායක මහතාගෙන් ලැබුණු 2021.12.07 දිනැති පෙත්සම

ගරු අනුර දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මාතර, කැකුණදුර, නාකුට්ටියගම, අංක 630 දරන ස්ථානයෙහි පදිංචි කේ. එල්. අමරසේන මහතාගෙන් ලැබුණු 2022.02.01 දිනැති පෙත්සම;

(ii) මීගොඩ, පුවක්ගහහේන, ශ්‍රී ගුණානන්ද නාහිමි මාවත, අංක 307/2 දරන ස්ථානයෙහි පදිංචි එල්. පී. නිශාන්ති මහත්මියගෙන් ලැබුණු 2022.01.07 දිනැති පෙත්සම;

(iii) මාතලේ, උඩපිහිල්ල, අංක 72 දරන ස්ථානයෙහි පදිංචි එම්. එම්. රත්නායක මහතාගෙන් ලැබුණු 2022.01.05 දිනැති පෙත්සම; සහ

(iv) හබරාදූව, ලියනගොඩ, "අළුත් ගෙදර" යන ලිපිනයෙහි පදිංචි මොහාන් අමරසිංහ මහතාගෙන් ලැබුණු 2022.01.24 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) බොරලන්ද, හවරියමුල්වල යන ලිපිනයෙහි පදිංචි දයාපාල වීරකෝන් මහතාගෙන් ලැබුණු 2021.09.01 දිනැති පෙත්සම ගරු චමින්ද විජේසිරි මහතා විසින් පිළිගන්වන ලදී.

(4) අනුරාධපුරය, යසසිරිපුර, 3 වැනි පටුමග, අංක 210 දරන ස්ථානයෙහි පදිංචි එච්. මර්වින් විමලසූරිය මහතාගෙන් ලැබුණු 2022.01.31 දිනැති පෙත්සම ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා විසින් පිළිගන්වන ලදී.

(5) හාරිස්පත්තුව, මැදවෙල, තෝරදෙණිය පාර, අංක 101/ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්. යූ. ආර්. එස්. ජයතිලක මහතාගෙන් ලැබුණු 2022.01.11 දිනැති පෙත්සම ගරු ගුණතිලක රාජපක්ෂ මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1, 2 සහ 3 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින න්‍යාය පත්‍රයේ අයිතම අංක 1, 2 සහ 3හි සඳහන් පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා පිළිබඳ වැඩකටයුතු අවසන් වූ වහාම ආණ්ඩුවේ වැඩකටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයන් සමාජය තුළ සක්‍රිය පුද්ගලයන් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම:** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු අශෝක් අබේසිංහ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රියව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රිය පුද්ගලයන් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා. 1/2022)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. දේශීය බීජ නිෂ්පාදන ක්‍රියාවලිය පණගැන්වීම:** ගරු රෝහණ බංඩාර මහතා, ගරු චමින්ද විජේසිරි මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— වර්තමානය වනවිට දේශීය බීජ නිෂ්පාදනය විදේශීය සමාගම්වල ග්‍රහණයට හසු වී තිබෙන හෙයින් ද, එමඟින් දේශීය කෘෂි කර්මාන්තයට අහිතකර ප්‍රතිඵල අත් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා.15/2022)

(අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.00 ට ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.)

**8. ශ්‍රී ලංකාවේ මනෝ උපදේශකවරුන්/ මනෝ චිකිත්සකවරුන් නියාමනය කිරීම:** ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, ගරු බුද්ධික පතිරණ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— වෘත්තීමය නොවන සහ කිසිදු සායනික පුහුණුවක් නොමැති ව්‍යාජ මනෝ උපදේශකවරුන් සහ මනෝ චිකිත්සකවරුන් ශ්‍රී ලංකාව පුරා ව්‍යාපාර සිදුකරගෙන යෑම නිරීක්ෂණය වී ඇති හෙයින් ද, විවිධ අධ්‍යාපන ආයතනවලින් ඩිප්ලෝමා සහතිකයක් පමණක් ලබාගෙන කිසිදු සායනික පුහුණුවක් හෝ වෘත්තීය ආචාරධර්මයකට අනුගත නොවී විවිධ ආයතන පිහිටුවා ගනිමින් සමාජ මාධ්‍ය ඔස්සේ තමන් මනෝ උපදේශකවරයෙකු/ මනෝ චිකිත්සකවරයෙකු ලෙස හුවා දක්වමින් තම සායනවලට ජනතාව ගෙන්වාගැනීමේ තත්ත්වයක් වර්ධනය වී ඇති හෙයින් ද, මනෝ චිකිත්සකවරු සහ මනෝ උපදේශකවරු

මෙන්ම මනෝ උපදේශනය සහ චිකිත්සනය පිළිබඳ ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා නිසි නියාමනයකට ලක්කිරීම, මනෝ-සමාජීය සේවාවන්ට ප්‍රවේශවීමේ දී නිසි ක්‍රියා පිළිවෙතක් සැකසීම, ලිංගික විවිධත්වය තුළ යල් පැනගිය ප්‍රතිකර්ම වන පරිවර්තන චිකිත්සා තහනම් කිරීම යනාදිය පිළිබඳ විශේෂ සැලකිල්ලක් යොමුකර ශ්‍රී ලංකාවාසී පුරවැසියන්ට නිසි මනෝ-.සමාජීය සෞඛ්‍ය සේවා ප්‍රවේශයකට මග සලසාදීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා.21/2022)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි ඉඩම් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

"ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.23 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

මූලාසනාරූඪ මන්ත්‍රීවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 11 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතු ය" යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී .

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**10. කල් තැබීම:** එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් අද දින සභා සම්මතිය අනුව මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 මාර්තු 22 අඟහරුවාදා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.